සැ. යු. - 2010.05.21 වැනි දින පළවූ අංක 1655 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,656 - 2010 මැයි මස 26 වැනි බදාදා - 2010.05.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1140 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1153 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1157 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජූනි මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 මැයි මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08.,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## වයඹ පළාතේ පළාත් සභාව

### උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් ප්‍රාථමික - ශිල්පීය නොවන සහ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවක ගණයේ තනතුරු සඳහා නියමිත සුදුසුකම් ඇති උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරු නාමය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | මාසික වැටුප | අවම අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|
| (ප්‍රාථමික - අර්ධ ශිල්පීය) III ශ්‍රේණිය | 1 | 06/2006(IV) පී එල්. 2-2006ඒ රු.12,210 - 10 x 130 - 10 x 145- 10x 160-12x 170- 18,600 | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) |
| (ප්‍රාථමික - ශිල්පීය නොවන) III ශ්‍රේණිය | 3 | 06/2006(IV) පී එල්. 1-2006ඒ රු.11,730 - 120 x 10 - 130 x 10- 14,500 x 10- 160 x 12 - 17,600 | - එම- |
| මුරකරු (කොන්ත්‍රාත් පදනම මත) | 1 | වැඩකරන දිනකට රු. 391 සහ අදාළ ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ. | -එම- |
| සෞඛ්‍ය කම්කරු (කොන්ත්‍රාත් පදනම මත) | 2 | වැඩ කරන දිනකට රු. 391 සහ අදාළ ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ. | රජයේ අනුමත පාසලක 08 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය. |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම්* :

(i) අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18 ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතුය. (දැනට සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.).

(ii) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.

(iii) අයදුම්කරු උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අවුරුදු 03ක් ස්ථිර පදිංචි අයෙකු විය යුතුය. (පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන සහතිකය ප්‍රාදේශීය ලේකම් අනු අත්සන යොදා තිබිය යුතුය.).

(iv) අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

(vi) උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/සේවා ගිවිසුම් මත සේවය කරන සේවකයින්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(vii) අයදුම්කරුවන් ඒ ඒ තනතුර ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(viii) ප්‍රාථමික අර්ධ ශිල්පීය තනතුර සඳහා අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක රාජ්‍ය සංස්ථා /මණ්ඩල/ව්‍යවස්ථාපිත ආයතනයක හෝ වෙනත් රජයේ පිළිගත් ආයතනයක යටත් පිරිසෙයින් වසර 2කට වැඩි කාලයක් සේවය කර තිබීම. (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) ප්‍රාථමික අර්ධ ශිල්පීය සහ ශිල්පීය නොවන තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය;

(ii) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය;

(iii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයට යටත්වේ;

(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද මුදල් රෙගුලාසිවලට ද පළාත් පාලන දෙපාර්තමේන්තු නියෝගවලටද රජයේ හෝ වයඹ පළාත් සභාව හෝ උඩුබද්දාව ප්‍රාදේශීය සභාව විසින් දැනට නිකුත් කර ඇති හෝ ඉදිරියේ දී වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

(v) කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා තනතුරුලාභීන් සේවක අර්ථ සාධක අරමුදලට දායක විය යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය* :

(i) අවශ්‍යතාවය අනුව ප්‍රායෝගික හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු අය තෝරා ගැනේ.

(ii) අයදුම්පත් සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය :-

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතික,
(iii) පදිංචිය සනාථ කිරීම පිණිස ග්‍රාම නිලධාරි නිකුත් කරන සහතිකය (ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව),
(iv) මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක්,
(v) වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික තිබේ නම් එම සහතික,
(vi) දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් සේවා ගිවිසුම් පදනම මත සේවය කරන්නේ නම් එම පත්වීම් ලිපි සහ සහතික.

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් කරනු ලැබේ.

06. *අයදුම්පත් ඉදිරිපත් කිරීම* :

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2010.07.15 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලේකම්, ප්‍රාදේශීය සභාව, උඩුබද්දාව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

අයි. එම්. ඩී. ඉලංකෝන්,
ලේකම්,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාව.

2010ක්වූ මැයි මස 11 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

*උඩුබද්දාව ප්‍රාදේශීය සභාව*

........................................................................ *තනතුර සඳහා අයදුම් පත්‍රය*

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :————.
මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

02. තැපැල් ලිපිනය :————.

03. උපන් දිනය :
වර්ෂය:————. මාසය:————. දිනය:————.

04. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
අවුරුදු :————. මාස:————. දින:————.

05. විවාහක/අවිවාහක බව :————.

06. ජාතිය :————.

07. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? (එසේනම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග) :————.

08. අධ්‍යාපන සුදුසුකම් :————.

09. වෘත්තීය සුදුසුකම් :————.

10. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්,
(i) දැනට දරන තනතුර :————.
(ii) එම තනතුරට පත්වූ දිනය :————.
(iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම/සේවා ගිවිසුම් මත ද යන වග) :————.
(අදාළ පත්වීම් ලිපියේ ඡායා පිටපතක් අමුණන්න).

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත්, දන්වමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

05-745

## ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

### තනතුරු ඇබෑර්තු

වයඹ පළාත් රාජ්‍ය සේවයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ රියැදුරු III (ශිල්පීය) තනතුරට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

පහත දැක්වෙන කරුණුවලට අදාල අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍රයක් සම්පූර්ණකර " ලේකම්, ප්‍රාදේශීය සභාව, ඉබ්බාගමුව" යන ලිපිනයට 2010.05.31 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

| 01. | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අවම සුදුසුකම්* |
|---|---|---|---|---|
| | රියැදුරු | 02 | P.L.3.2006A<br>රු.12,470 - 10 x 130 - 10 x 145 -10 x 160-12 x 170 - රු. 18,860 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සා.පෙළ විභාග යේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් 2කට සම්මාන සහිතව විෂයයන් 06ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) අවම වශයෙන් එක් වතාවක දී විෂයයන් 05ක් සමත් විය යුතුය.<br><br>නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක දිනවන විට ප්‍රාථමික ශිල්පීය තනතුරු සඳහා අනියම් /ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයන්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවැති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාලවේ. |

02. ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා හා පලපුරුද්ද :-

(i) තාර බර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුයි. (A පන්තියේ රියැදුරු බලපත්‍රයක්)
(ii) වාහන රියැදුරකු වශයෙන් වසර 03ක පලපුරුද්දක් තිබිය යුතුයි. (සේවා සහතික මගින් සනාථ කළ යුතුවේ.)

03. *බඳවා ගැනීමේ ක්‍රමය :*

අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම කරනු ලැබේ.

04. *සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු පුරුෂ/අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.
(ii) තෝරාගනු ලබන්නේ අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්වය. එම කාලය තුළදී වැඩ , පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලැබේ.

05. *වෙනත් පොදු කොන්දේසි :-*

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුයි. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
(ii) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ශ්‍රී ලාංකික විය යුතුය.
(iii) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුයි. තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.
(iv) දණ්ඩනීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතුයි.
(v) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටතේ පිරිසෙයින් වසර 03කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචි අයෙකු විය යුතුයි. ඡන්ද හිමි නාම ලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුවේ.
දැනටමත් ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ ස්ථිර, අනියම්, ආදේශක, දීමනා, කොන්ත්‍රාත්, පදනම් මත සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. (සතුටුදායක සේවා කාලයක් තිබූ බවට සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතුයි.)

(vi) රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පූර්වාසන්න වන අවුරුදු 05ක කාලය තුළ වරදකට (අවවාද කිරීම් හැර) දඬුවමක් ලබා නැත්තාවූ ද, මෙම කාලය තුළ යෙදුනු වැටුප් වර්ධක නිශ්චිත දිනට ලබාගත්තාවූ ද, සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුයි. තෝරාගනු ලැබුවහොත් ඔවුන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට තවදුරටත් දායක විය යුතුයි.

(vii) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද මුදල් රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

06. *අයදුම්කළ යුතු ආකාරය* :-

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2010.05.31 දිනට හෝ එදිනට පෙර ලේකම්, ප්‍රාදේශීය සභාව, ඉබ්බාගමුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ ඉහල වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුයි. (දැනටමත් රාජ්‍ය, පළාත් රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුයි.)

අයදුම්පත ඒ4 ප්‍රමාණයේ කඩදාසිවල ඉදිරිපත් කළ යුතුයි. අසම්පූර්ණ පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායාපිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතුයි :-

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතික ;
(iii) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය ;
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් ;
(එක් සහතිකයක් ග්‍රාම නිලධාරියාගෙන් විය යුතුයි.)
(v) ශිල්පීය නිපුණතා හා වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතිකය ;
(vi) රියැදුරු බලපත්‍රය ;
(vii) සේවා සහතිකය (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට පමණි)

08. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවාගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය. දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතු ය.

ඒ. පී. මුතුසිංහ,
ලේකම්(වැ.බ.),
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2010 අප්‍රේල් මස 30 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත**

***වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ රියැදුරු තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත්‍රය***

01. (අ) මුලකුරු සමග නම :———————.

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :———————.

02. (අ) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :———————.

(ආ) ස්ථිර පදිංචි ලිපිනය :———————.

03. ස්ත්‍රී/පුරුෂභාවය :———————.

04. *(අ)* උපන්දිනය :———————.

*(ආ)* .................................... දිනට වයස : අවුරුදු :———————. මාස :———————. දින :———————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :———————.

06. විවාහක/අවිවාහක බව :———————.

07. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග:———————.

08. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද ? එසේ නම් විස්තර :———————.

09. අධ්‍යාපන සුදුසුකම් :

(අ) විභාගයේ නම :——————.
(ආ) විභාග අංකය :——————.
(ඇ) විභාග වර්ෂය :——————.
(ඈ) සමත් විෂයයන් :——————.

10. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :——————.

11. ඔබ දැනටමත් මෙහි ආදේශක සේවය කරන්නේ නම් සේවා කාලය හා විස්තර , එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/දීමනා/ආදේශක ද යන වග) :-

12. වෙනත් සුදුසුකම් :——————.

13. මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරාගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා පහකිරීමට යටත් වන බවත් මම දනිමි.

————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*
*(දැනට සේවයේ නියුතු වූවන්ට පමණි)*

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත් තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදාහැරීමට එකඟ වන බවත්, දැනට ........................... වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :——————.

05-599

---

**නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව**

තනතුරු ඇබෑර්තු

මෙම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවත්නා වයඹ පළාත් රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ III ශ්‍රේණියට පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | |
|---|---|
| 1. සෞඛ්‍ය පරිපාලක තනතුරු | 02 |
| 2. කාර්යාල කාර්ය සහයක තනතුරු | 02 |
| 3. කාර්යාල කම්කරු තනතුර | 01 |
| 4. මුරකරු තනතුරු | 03 |

සියලුම තනතුරු 2008.11.19 දින වයඹ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුව පාලනය වන අතර එම පටිපාටිය අනුව ඉහත සඳහන් තනතුරු නාම අනුව බඳවා ගනු ලැබුවද සේවක ගණයට අදාල ඕනෑම තනතුරක රාජකාරි ඉටු කරන ලෙස පත්වීම් බලධරයා /ආයතන ප්‍රධානියාට පැවරිය හැක.

ඒ අනුව ඉහත සඳහන් සේවයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයට අදාලව පවරනු ලබන ඕනෑම තනතුරක රාජකාරි ඉටු කිරීමට බැඳී සිටිය යුතුය.

2. අධ්‍යාපන සුදුසුකම් :-

(i) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී විෂයයන් දෙකක්වත් සමත්වී තිබිය යුතුයි. (වෛකල්පිත විෂයන් හැර)

(ii) 2008.11.19 දින වන විට අනියම්/ආදේශක කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ ඔවුන් බඳවා ගන්නා අවස්ථාවේ අනුමතව පැවති බඳවා ගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාලවේ.

*වයස.-* අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අයෙකු විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට ද මෙම ප්‍රාදේශීය සභාවේ අනියම්/ආදේශක හෝ වෙනත් පදනමකින් සේවයේ නියුතු අයට ද උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

වෙනත් :-

*(i)* සෑම තනතුරකටම බඳවා ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ 11 වැනි පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති අදාල වේ.
*(ii)* ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
*(iii)* අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 3ක් තුළ නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වසර 3ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතුයි.
*(iv)* විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුත් අයෙකු විය යුතුයි.
*(v)* දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුයි.

4. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-

*(i)* මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අයකෙරේ.
*(ii)* වැටුප් ක්‍රමය.- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව 6-2006(iv) PL-2006A වැටුප් ක්‍රමයේ රු. 11,730-120x10-130x10-145x10-160x12-රු.17,600 හි ආරම්භක වැටුප් පියවරේ පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.
*(iii)* සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කෙරේ.

5. තනතුර සඳහා ඉල්ලීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් මෙහි දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2010.07.02 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "ලේකම්, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව, නාත්තන්ඩිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

6. තනතුරු එකකට වැඩි ගණනක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් ඒ සඳහා වෙන වෙනම අයදුම්පත් එවිය යුතුය.

7. අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කරන ලද පිටපත් ද එවිය යුතුය.

*(අ)* උප්පැන්න සහතිකය;
*(ආ)* අධ්‍යාපන සහතික ;
*(ඇ)* ස්ථිර පදිංචිය තහවුරු කිරීමේ සහතික ;
*(ඈ)* මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් ;
(ඉන් එකක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරියාගෙන් විය යුතුය.)
*(ඉ)* වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික ;
*(ඊ)* සේවා පලපුරුද්ද පිළිබඳ සහතික

ආර්. එම්. චන්ද්‍රාවතී මැණිකේ,
වැඩ බලන ලේකම්,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව.

2010 මැයි මස 12 වැනි දින දීය.

***නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික ශිල්පීය/ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු සඳහා ආදර්ශ අයදුම්පත්‍රය***

ඉල්ලුම්කරන තනතුර :———————.

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :———————.

02. තැපැල් ලිපිනය :———————.

03. උපන්දිනය :
අවුරුද්ද :———————. මාසය :———————. දිනය :———————.

04. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට (2010.............) වයස :
අවුරුදු :———————. මාස :———————. දින :———————.

05. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද ? :———————.
එසේ නම් පරම්පරාවෙන් ද ?/ ලියාපදිංචියෙන් ද ? :———————.

06. ස්ත්‍රී/පුරුෂභාවය :———————.

07. අධ්‍යාපන සුදුසුකම් :———————.

08. වෙනත් සුදුසුකම් :———————.

09. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචි කාල සීමාව :——————.
——————. සිට ——————. දක්වා

10. පෙර සේවය කර ඇති ස්ථාන :——————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මවිසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි වන අතර යම් හෙයකින් මා සාවද්‍ය තොරතුරක් සපයා ඇත්නම් පත්වීම් ලබා දීමෙන් අනතුරුව නිසි වන්දියකින් තොරව මා සේවයෙන් ඉවත් කළහැකි බවද, ඊට පෙර අනාවරණය වුවහොත් මෙම තනතුර ලබා ගැනීම සඳහා මා සුදුස්සෙකු නොවන බවද මම දනිමි.

එම සියළුම කොන්දේසිවලට මා යටත් වන බවද මෙයින් දන්වා සිටිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

05-723/2

---

## නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව

නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවත්නා වයඹ පළාත් රාජ්‍ය සේවයේ ප්‍රාථමික - ශිල්පීය සේවක ගනයේ 111 ශ්‍රේණියට අදාල පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා නාත්තන්ඩිය බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

01. ජලනල වැද්දුම්කරු තනතුර :-

මෙම තනතුර 2009.05.12 දින වයඹ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය තනතුරු සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුව පාලනය වේ.

02. අධ්‍යාපන සුදුසුකම් :-

අධ්‍යාපනික පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් එක් වතාවකදී විෂයයන් 05ක් සමත් විය යුතුය.

03. ශිල්පීය නිපුණතාවය/ප්‍රවීණත්වය :-

තනතුරේ කාර්ය භාරයට අදාලව තෘතියික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන NVQ 4 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

04. පළපුරුද්ද :-

පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 03ක පළපුරුද්දක් තිබීම (සේවා සහතික මගින් සනාථ කළ යුතුයි.)

05. වයස.- අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අයෙකු විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට ද මෙම ප්‍රාදේශීය සභාවේ අනියම්/ආදේශක හෝ වෙනත් පදනමකින් සේවයේ නියුතු අයටද උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

06. වෙනත් :-

*(i)* සෑම තනතුරකටම බඳවා ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ 11 වැනි පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති අදාල වේ.
*(ii)* ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
*(iii)* අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 3ක් තුල නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වසර 3ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතුයි.
*(iv)* විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුත් අයෙකු විය යුතුයි.
*(v)* දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

07. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-

*(i)* මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අය කෙරේ.
*(ii)* වැටුප් ක්‍රමය.- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6-2006 (iv) අනුව PL 3-2006 A වැටුප් ක්‍රමයේ රු. 12,740-130x10-145x10-160x10-170x12-18,860 හි ආරම්භක වැටුප් පියවරේ පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.
*(iii)* සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කෙරේ.

08. තනතුර සඳහා ඉල්ලීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් මෙහි දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2010.07.02 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "ලේකම් නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව නාත්තන්ඩිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

09. අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කරන ලද පිටපත් ද එවිය යුතුය :-

*(අ)* උප්පැන්න සහතිකය;
*(ආ)* අධ්‍යාපන සහතික ;
*(ඇ)* ස්ථිර පදිංචිය තහවුරු කිරීමේ සහතික ;
*(ඈ)* මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් ;
(ඉන් එකක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරියාගෙන් විය යුතුයි.)
*(ඉ)* වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික ;
*(ඊ)* සේවා පලපුරුද්ද පිළිබඳ සහතික.

ආර්. එම්. චන්ද්‍රාවතී මැණිකේ,
*වැඩබලන ලේකම්,*
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව.

2010 මැයි මස 12 වැනි දින,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික ශිල්පීය/ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු සඳහා ආදර්ශ අයදුම්පත්‍රය*

ඉල්ලුම්කරන තනතුර :——————.

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :——————.

02. තැපැල් ලිපිනය :——————.

03. උපන් දිනය :
අවුරුද්ද :——————. මාසය :——————. දිනය :——————.

04. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට (2010 ........................ ) වයස :
අවුරුදු :——————. මාස :——————. දින :——————.

05. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද ? :——————.
එසේ නම් පරම්පරාවෙන් ද ?/ ලියාපදිංචියෙන් ද ? :——————.

06. ස්ත්‍රී/පුරුෂභාවය :——————.

07. අධ්‍යාපන සුදුසුකම් :——————.

08.. වෙනත් සුදුසුකම් :——————.

09. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචි කාල සීමාව :
—————— සිට —————— දක්වා

10. පෙර සේවය කර ඇති ස්ථාන :——————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මවිසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි වන අතර යම් හෙයකින් මා සාවද්‍ය තොරතුරක් සපයා ඇත්නම් පත්වීම් ලබා දීමෙන් අනතුරුව නිසි වන්දියකින් තොරව මා සේවයෙන් ඉවත් කලහැකි බවද ඊට පෙර අනාවරණය වුවහොත් මෙම තනතුර ලබා ගැනීම සඳහා මා සුදුස්සෙකු නොවන බවද මම දනිමි.

එම සියලුම කොන්දේසි වලට මා යටත් වන බවද මෙයින් දන්වා සිටිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

05-723/1

## මුලටියන ප්‍රාදේශීය සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

මුලටියන ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරට ආදේශක පදනම මත බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *අධ්‍යාපන සුදුසුකම් :*

දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව ඇතුලත්ව විෂයයන් 06ක් සමත්ව තිබීම.

02. *පොදු සුදුසුකම් :-*

(i) සියළුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය;
(ii) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුතු විය යුතුය;
(iii) පූර්වාසන්න වසර 05ක කාලයක් මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය;
(iv) උසාවියකින් වරදකරුවෙකු හෝ මීට පෙර පළාත් පාලන ආයතනයක සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතුය.

03. *වයස් සීමාව :*

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුක්ත වන්නේ නම් උපරිම වයස් සීමාව අදාල නොවේ.)

04. *වැටුප් පරිමාණය :*

රු. 11,730 - 10 x 120 - 10 x 130-10 x 145 -12 x 160 - රු. 17,600
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි පී.එල්. 1- 2006ඒ

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
(iii) බඳවා ගැනීමේ කොන්දේසි වලට අමතරව ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි වල කොන්දේසිවලට ද දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වරින් වර පනවනු ලබන වෙනත් කොන්දේසි වලටද පළාත් පාලන ආයතන වලට අදාල ආඥාපනත්/පනත් වලට අයත් විධිවිධාන වලටද මුලටියන සභාව මගින් වරින් වර ගනු ලබන සභා සම්මුතිවලට ද අනුකූලව සේවය කිරීමට එකඟ විය යුතුය.
(iv) වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම සිදු කරනු ලබන අතර පහත සඳහන් සුදුසුකම්වලට ලකුණු ලබා දීම සිදු කෙරේ :

(i) අධ්‍යාපන සුදුසුකම් ;
(ii) වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ;
(iii) පළාත් පාලන ආයතනයක සේවය කර තිබීම හා ස්ථිර පදිංචිය ;
(iv) පෞරුෂත්වය හා සෞඛ්‍ය සම්පන්න බව ;
(v) වෙනත් විශේෂ කුසලතා.

මෙම එක් එක් ශීර්ෂය යටතේ ලකුණු 20 බැගින් උපරිම ලකුණු 100ක් හිමිවේ.

07. *ඉල්ලුම්කළ යුතු ආකාරය :*

(i) මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව තමන් විසින් සකස් කර ගත් අයදුම්පත්‍රයක් මගින් ඉල්ලුම් කළ යුතුය.
(ii) අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.
    (i) උප්පැන්න සහතිකය;
    (ii) අධ්‍යාපන සහතික ;
    (iii) වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්දට අදාල සහතික ;
    (iv) පදිංචිය සනාථ කිරීමේ සහතිකය ;

(v) මැතකදී ලබා ගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාම නිලධාරිගෙන් ලබා ගත යුතුය.)

(III) සියළුම අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර 2010.06.30 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "ලේකම්, ප්‍රාදේශීය සභාව, මුලටියන" යන ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතු අතර ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ අදාල තනතුරට අයදුම්කිරීම පිළිබඳ සඳහන් කළ යුතුය.

අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු හා සහතික අසත්‍ය බව හෝ සාවද්‍ය බව පෙනී ගියහොත් හෝ අයදුම්කරු හිතාමතාම යම්කිසි වැදගත් කරුණක් යටපත් කර ඇති බව පෙනී ගියහොත් සේවයේ යෙදී සිටින කවර අවස්ථාවකදී වුවද ඔහු හෝ ඇය සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වනු ඇත.

ජයරත්න ගරුසිංහ,
ලේකම් (වැඩබලන),
මුලටියන ප්‍රාදේශීය සභාව.

2010 මැයි මස 12 වැනි දින,
මුලටියන,
මුලටියන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*මුලටියන ප්‍රාදේශීය සභාවේ කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ මුලකුරු සමග නම :——————.

02. මුලකුරු වලින් හැඳින්වෙන නම :——————.

03. ස්ථිර ලිපිනය :——————.

04. ස්ත්‍රී පුරුෂ භාවය :——————.

05. උපන්දිනය :
අවුරුදු :——————, මාස :——————, දින :——————.

06. 2010.06.30 දිනට වයස :
අවුරුදු :——————, මාස :——————, දින :——————.

07. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

08. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද ? ලියාපදිංචිවීමකින් ද යන වග? :——————.

09. විවාහක/අවිවාහක භාවය :——————.

10. මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි කාලය :——————.

11.. අධ්‍යාපන සුදුසුකම් :——————.

12. වෘත්තීය සුදුසුකම් :——————.

13. සේවා පළපුරුද්ද :——————.

14. වෙනත් විශේෂ කුසලතා :——————.

මෙහි සඳහන් තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දනිමි.

——————;
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

*රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

ඉහත නම් සඳහන් ................................ මයා/මිය/මෙනවිය මෙම ආයතනයේ .................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මෙම තනතුරට තෝරාගතහොත් සේවයෙන් නිදහස් කළහැකිය/නොහැකිය. ඔහු/ඇය කිසිදු විනයානුකූල දඬුවමකට මෙතෙක් ලක් වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————;
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :——————.

05-732

## කඩුගන්නාව නගර සභාව

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කඩුගන්නාව නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුම් ඇති යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (කඩුගන්නාව නගර සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර, අනියම්, තාවකාලික ආදේශක සේවකයින් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.)

| *තනතුරු නාමය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| (01) රියදුරු | 01 | 06/2006 IV - PL3<br>12,740 - 130 x 10 - 145 x 10- 150x 10- 170 x 12 - 18,860<br><br>(ආරම්භක වැටුප් පියවර) | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය. |
| (02) සෞඛ්‍ය සුළු පරිපාලක | 01 | 06/2006 IV<br>රු.13,120 - 10 x 145 - 11 x 170- 10x 240- 10 x 320 - 22,040<br>පෙර කාර්යක්ෂමතා කඩඉම) | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය/විද්‍යාව/සිංහල භාෂාව යන (හතරවැනි වැටුප් පියවරට එළඹීමට විෂයයන් ද ඇතුලුව විෂයයන් 5කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් සමත් වී තිබීම.<br>*හෝ*<br>ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සමත් අයදුම්කරුවන් ඉහත සඳහන් විෂයයන් සඳහා 'බී' ශ්‍රේණියේ සාමාර්ථ පහක් ලබා තිබිය යුතුය.<br><br>සිංහල/දෙමළ, භාෂාව ගණිතය/අංක ගණිතය/වාණිජ අංක ගණිතය ඇතුලු වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම. පළාත් පාලන ආයතනයක ස්ථිර තනතුරක් දරන්නෙකුවීම. |
| (03) සෞඛ්‍ය කම්කරු | 04 | 06/2006 IV -PL1<br>11,730 - 10 x 120 - 10 x 130- 10 x 145- 12 x 160 - 17,600<br>(ආරම්භක වැටුප් පියවර) | අවම වශයෙන් 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය. |
| (04) ආයුර්වේද කම්කරු | 01 | 6/2006 IV - PL1<br>11,730 - 10 x 120 - 10 x 130- 10 x 145- 12 x 160 - 17,600<br>(ආරම්භක වැටුප් පියවර) | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය. |

2. *බඳවාගැනීමේ ක්‍රමය :-*

(i) අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම කරනු ලැබේ.

රියදුරන් බඳවා ගැනීමේ ක්‍රමය :-

(i) සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.
(ii) ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන්නාවූ අයදුම්කරුවන් පත් කිරීමට පෙර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් මෝටර් වාහන පරීක්ෂකවරයෙකු හා පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙකුගෙන් ද එක් මාණ්ඩලික නිලධාරියෙකුගෙන් ද සමන්විත තිදෙනෙකුට නොඅඩු මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැණීමේ වෘත්තීය පරීක්ෂණයෙන් සමත් විය යුතුය.
(iii) සේවයට බඳවා ගැනීම අදාල පළාත් පාලන ආයතනයේ පත්වීම් බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

*රියදුරන් බඳවා ගැනීමේ සුදුසුකම් :-*

(i) ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුයි. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශය තුළ යටත් පිරිසෙයින් වසර 03කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචිය ඇති අයෙක් විය යුතුය. (ලිඛිත සාක්ෂි මගින් සනාථ කළ යුතුය.)
(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
(iii) අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසැලකින් අවම වශයෙන් 08 වන ශ්‍රේණිය/9 වසර සමත් වී සිටිය යුතුය.

(iv) අවම උස අඩි 5 අඟල් 2 1/2ක් විය යුතුය.
(v) දිවා කාලයේ දී සහ රාත්‍රි කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක් තිබිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.

*රියදුරන් සඳහා වෘත්තීය සුදුසුකම් :*

(i). රියදුරු 11 ආ බණ්ඩයට බඳවා ගැනීමේදී පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුයි. (බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අදාල සහතිකය ලබා සිටිය යුතු ය. වාහන පන්ති සී සහ සී 1)
(ii) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය.
(iii) වාහන රියදුරකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතු ය. (සහතික මගින් සනාථ කළ යුතු ය.)

*3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.
(ii) එසේම රාජ්‍ය සේවා පත්කිරීම් අදාල වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.
(iii) තෝරාගනු ලබන්නන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, එම කාලය තුළ වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායක තත්වයක නොමැති වුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

*4. වෙනත් පොදු කොන්දේසි :*

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
(ii) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික විය යුතු ය.
(iii) විශිෂ්ඨ චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය. තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.
(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතු ය.
(v) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශය තුළ යටත් පිරිසෙයින් වසර 03කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචිය ඇති අයෙක් විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතු ය. )
(vi) රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබුවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබුවෙකු නොවිය යුතු ය.
(vii) රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පූර්වාසන්න වන අවුරුදු 05ක කාලය තුළ වරදකට (අවවාද කිරීම් හැර) දඬුවමක් ලබා නැත්තාවූ ද, මෙම කාලය තුළ යෙදුණු වැටුප් වර්ධක නිශ්චිත දිනට ලබාගත්තාවූ ද, සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය. තෝරා ගනු ලැබුවහොත් ඔවුන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට තවදුරටත් දායක විය යුතු ය.
(viii) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට, රජයේ දෙපාර්තමේන්තු නියෝග වලට ද, මධ්‍යම පළාත් සභාව හෝ කඩුගන්නාව නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි සහ නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

*5 අයදුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2010 ජූනි මස 11 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම්, කඩුගන්නාව නගර සභාව, කඩුගන්නාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු ය. (දැනටමත් රාජ්‍ය පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය. අයදුම්පත ඒ4 ප්‍රමාණයේ කඩදාසිවල ඉදිරිපත් කළ යුතු ය.) අසම්පූර්ණ හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායාපිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේදී මුල් සහතික ඉදිරිපත් කළ යුතු ය :-

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතික,
(iii) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් සහතිකය
(iv) මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය.)
(v) සේවා සහතික (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වුවන්ට පමණි)

7. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම, සංශෝධනය කිරීම ආදී සියලු බලතල කඩුගන්නාව නගර සභාවේ ලේකම් සතු ය.

එම්. වී. ඒ. බී. විජේරත්න බණ්ඩා,
ලේකම්,
කඩුගන්නාව නගර සභාව,
කඩුගන්නාව.

2010 මැයි මස 12 වැනි දින,
කඩුගන්නාව නගර සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

***කඩුගන්නාව නගර සභාව***

*...................................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. මුලකුරු සමග නම :————.
    මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
02. ස්ථිර ලිපිනය :————.
03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :————.
05. උපන් දිනය : වර්ෂය:————. මාසය:————. දිනය:————.
06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :————. මාස:————. දින:————.
07. ස්ත්‍රී/පුරුෂ බව :————.
08. විවාහක/අවිවාහක බව :————.
09. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන්ද ? යන වග :————.
10. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
    *අ.පො.ස. සා.පෙළ විභාගය :*
    සමත් වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| *01.*<br>*02.*<br>*03.*<br>*04.* | | *05.*<br>*06.*<br>*07.*<br>*08.* | |

11. (i) වෙනත් අධ්‍යාපන සුදුසුකම් :————.
    (ii) වෘත්තීය සුදුසුකම් :————.
    (iii) සේවා පළපුරුද්ද :————.

12. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර :————.
    ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්/ආදේශක ද යන වග :————.
    එම තනතුරට පත් වූ දිනය :————.

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසුව එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බවද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන ............................. මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ ............... කු වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————;
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————;
තනතුර :——————;
ආයතනය :——————;
දිනය :——————.

05-717

# පළාත් පාලන නිවේදන

## නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව

සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ හෝ අනුමත කර ඇති හෝටල්, ආපන ශාලා, ලැගුම්හල් වලින් ගාස්තු අයකිරීම - 2010 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 149 වැනි වගන්තිය ප්‍රකාර නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා පාලන සීමාව තුල යම් හෝටලයක්, ආපනශාලාවක් හෝ ලැගුම්හලක් වශයෙන් පාවිච්චි කරනු ලබන්නාවූ ද, ඒ හෝටලය, ආපනශාලාව ලැගුම්හල (1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා) ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තාවූ අවස්ථාවක එම හෝටලයේ, ආපනශාලාවේ හෝ ලැගුම්හලේ එම වර්ෂයට පෙරාතුව වූ වර්ෂය සඳහා වූ ලැබීම් වලට අදාල වූ එම ලැබීම් වලින් සියයට එකක (1%) ගාස්තුවක් එම හෝටලය, ආපනශාලාව, ලැගුම්හල පවත්වාගෙන යන අය විසින් මෙම සභාව වෙත 2010 මාර්තු 31 වැනි දිනට ප්‍රථම ගෙවිය යුතු බවත්, එම හෝටලය, ආපනශාලාව, ලැගුම්හල ක්‍රියාත්මක වන පළමු අවුරුද්ද වන විට එම ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව නියම කරනු ලබන ගාස්තු ගෙවිය යුතු බවත් 2009.10.29 දින මහ සභා රැස්වීමේදී තීරණය පරිදි මෙයින් දැනුම් දෙමි.

සනත් ශ්‍රීමාල් පෙරේරා,
සභාපති,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව.

2009 ඔක්තෝබර් මස 30 වැනිදා,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

05-724/9

---

## නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව

2010 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාර සැලසී ඇති විධිවිධාන පරිදි නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දා වූ පහත උපලේඛනයෙන් දක්වා ඇති ප්‍රදේශ තුළ පිහිටි නිශ්චල දේපල වල වාර්ෂික වටිනාකමින් 5%ලෙස නියම කල එකී බදු මුදල් පිළිවෙලින් 2010 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි හෝ ඊට ප්‍රථම වාරික (04) හතරකින් අයකර ගැනීමට 2009.10.29 දින පැවති මහ සභා රැස්වීමේ දී තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

තව ද එකී පනතේ 134(7) වැනි වගන්ති ප්‍රකාර වාර්ෂික බදු මුදල් 2010 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට පෙර මුලු වර්ෂයකට ලද බද්ද ගෙවනු ලැබුවහොත් එම මුදලින් (10%) සියයට දහයක වට්ටමක් ද බදු මුදල වාරික වශයෙන් ගෙවන විට වරිපනම් බද්ද ගෙවිය යුතු කාර්තුවේ පළමු මාසය තුල ගෙවනු ලැබුවහොත් එසේ ගෙවනු ලබන මුදලින් (5%) සියයට පහක වට්ටමක් ද ගෙවනු ලැබේ.

සනත් ශ්‍රීමාල් පෙරේරා,
සභාපති,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව.

2009 ඔක්තෝබර් මස 30 වැනි දින,
නාත්තන්ඩිය,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

01. නාත්තන්ඩිය අභාවිත සුලු නගර සීමාවේ ඇතුලත උඩුබද්දාව මාරවිල මාර්ගයේ නාත්තන්ඩිය නගර සීමා පුවරු ඇතුලත පිහිටි ප්‍රදේශය ද හලාවත නාත්තන්ඩිය පාරේ නාත්තන්ඩිය නගර සීමාව දක්වා ප්‍රදේශය සහ නාත්තන්ඩිය මීගමු මාර්ගයේ නගර සීමා ප්‍රදේශය.

02. යටකලන්පත්තුව අභාවිත ගම්සභා ප්‍රදේශය ඇතුලත හලාවත, මීගමුව ප්‍රධාන මාර්ගයේ මහවැව සිට දෙමටපිටිය දක්වා දියුණු කළ ගම් ප්‍රදේශය සහ තොඩුවාව දියුණු කල ගම් ප්‍රදේශය දක්වා ප්‍රදේශය.

05-724/4

## පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

### කහවත්ත ප්‍රාදේශීය සභාව

261 අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර කහවත්ත ප්‍රාදේශීය සභාව විසින් 2007.10.24 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී පහත උපලේඛනයේ සඳහන් අංක 05-11 දරන යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රියන්ත උපුල් හේවගේ,
සභාපති,
කහවත්ත ප්‍රාදේශීය සභාව.

2010 මැයි මස 07 වැනි දින,
කහවත්ත ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සාදනු ලැබූ , හා 1988.08.23 දිනැති හා අංක 520/7 දරන ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ (ආ)* වන කොටසේ නිවේදනය කර, සබරගමු පළාත් සභාව විසින් 1990.08.16 දින කියවා සම්මත කර 1990.12.17 දින අංක 642/10 දරන ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ (ආ)* වන කොටසේ පළ කරන ලද්දාවූ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා කහවත්ත ප්‍රාදේශීය සභාව විසින් 2007.10.24 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ අංක 05-11 දරන තීරණයෙන් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

05-722

---

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

### දික්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි නාම වෙනස් කිරීම

| *පැරණි නම* | *යෝජිත නම* |
|---|---|
| වේහැල්ල මාහරණ පාර සිට රදම්පළ හීන්දැලිය වැව දක්වා වැටී ඇති පාර | රණවිරු එම්. එම්. පී. නිශාන්ත රුවන් කුමාර මාවත |

එම්. එච්. ටී. අයි. පී. ක්‍රිෂාලි,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව,
දික්වැල්ල.

2010 මැයි මස 07 වැනි දින,
දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

05-618

---

## මාවතගම ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24(2) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම ප්‍රාදේශීය සභාව විසින් මෙහි අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති මාර්ගය මාවතගම ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම මාර්ගය සම්බන්ධයෙන් අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම් මේ නිවේදනයේ සිට එක් මසක් ඇතුලත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධතාවයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මාර්ගය මාවතගම ප්‍රාදේශීය සභාව සතු මාවතක් වශයෙන් පිළිගෙන පාලනය කරන බව, පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශනයට පත් කරමි.

එච්. එස්. කේ. බී. මීගොල්ල,
සභාපති,
මාවතගම ප්‍රාදේශීය සභාව - මාවතගම.

2010 මැයි මස 05 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය සභාවේ දී ය.

මාවතගම ප්‍රාදේශීය සභාව

*මාර්ගයක් ගැසට් පත්‍රයට යැවීම*

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | වැවගෙදර වැල්හේනවත්ත පාර |
| ග්‍රා. නි. වසම | : | 705, වැවගෙදර |
| මාර්ගයේ දුර | : | අඩි 420 |
| පළල | : | අඩි 15 |
| මාර්ගය ආරම්භ වන ස්ථානය | : | බරන්දන ප්‍රධාන පාරේ සිට වැවගෙදරට යන ගම මැද පාර |
| මාර්ගය අවසන් වන ස්ථානය | : | ආර්. රාජපක්ෂ මයාගේ ඉඩම |
| මාර්ගය වම් පස ඉඩම් හිමියන් | : | එච්. පී. ගුණරත්න මහතා<br>එම්. පේමරත්න මහතා<br>එච්. එස්. ජයරත්න මහතා<br>ආර්. අකුරණගේ සිරිසේන මහතා<br>ආර්. රාජපක්ෂ මහතා |
| මාර්ගය දකුණු පස ඉඩම් හිමියන් | : | අරුක්වත්ත මහතා |

05-602

---

**1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 11 වන වගන්තිය යටතේ පළාත් පාලන නිවාස සහ ඉදිකිරීම් ගරු අමාත්‍ය ආර්. ප්‍රේමදාස මැතිතුමා විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථා 42ක් ඇතුළත් 1988.08.23 දින දරන අංක 520/7 *අති විශේෂ ගැසට් නිවේදනය* කුලියාපිටිය ප්‍රාදේශීය සභාව සඳහා ක්‍රියාත්මක කිරීමට පිළිගැනීම**

